## Abstract 27

# පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය පිළිබඳ බෞද්ධ චින්තනය

**එම්. ඒ. අයි. යූ. විජේතිලක,**
(ශාස්ත්‍රවේදී, ප්‍රථම වසර),
*udayangawijetilaka69@gmail.com*

ලෝකය සහ පුද්ගලයාගේ ක්‍රියාකරකම් කිසියම් සර්ව බලධාරී දෙවි කෙනෙකුගේ බලපෑම නිසා සිදුවන බවත් ඒ අනුව පුද්ගලයාගේ උපතේ සිට මරණය දක්වා සියල්ල සිදුවන බවත් ලෝකයේ ඇතැම් සුප්‍රකට ආගම් හා දර්ශනවාදීන් විසින් පවසා ඇත. ආගම් පිළිබඳ අධ්‍යයනයේ දී ඒවා හැඳින්වෙනුයේ ඊශ්වරවාදී ආගම් වශයෙනි. මෙම ඉගැන්වීම් අනුව පුද්ගලයා යනු නිෂ්ක්‍රීය නිර්මාණයක් වේ. ඔහුගේ ශක්තියට හා ස්වාධීනත්වයට මෙම විශ්වය තුළ කළ හැකි දෙයක් නොමැත. බුදුන් වහන්සේ එම මතය ඉවත දමා විශ්වයේ සෑම සත්ත්වයෙකුට ම ස්වායත්ත ස්වාධීන බලයක් හා ශක්තියක් ඇති බවත් එය මිනිසා විසින් තේරුම් ගත යුත්තක් බවත් එම ක්‍රියාකාරකම්වලට හිමිකරුවා සහ වගකිව යුත්තා ද ඔහු ම වන බව පෙන්වා දුන්හ. එහෙයින් බුදුදහම මානව කේන්ද්‍රීය දහමක් ලෙස සැලකේ. බුදුදහම පුද්ගල ශක්තිය හා ඔහුගේ ස්වාධීනත්වය තහවුරු කළ ද බුදුදහමේ ද ඔහුට හෝ ඇයට තම ශක්තිය හා ස්වාධීනත්වය ක්‍රියාත්මක කළ හැකි ප්‍රමාණයක් හෝ වපසරියක් ඇති බව පිළිගනී. මෙය වෙනත් විධියකින් කිවහොත් ඔහු හෝ ඇය සතු ශක්තිය හා ස්වාධීනත්වය සාකල්‍යයෙන් ම පූර්ණ වූවක් නොවේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ පුද්ගලයා සතු ශක්තියේ හා ස්වාධීනත්වයේ සීමාවන් හඳුනා ගැනීම සහ ඔහුට ඉහළින් ක්‍රියාත්මක වන විශ්ව බල හෝ නියමයන් හෝ කවරේ ද ඒවා අතික්‍රමණය කිරීම මිනිසාට කළ හැකි ද සහ එසේ කළ හැකි නම් ඊට බුදුදහමින් පෙන්වා දී ඇති උපාය මාර්ගය කවරේ ද යන්න සමීක්ෂණය කිරීම යි. තම බාහිර ශක්තිය දියුණු කිරීමෙන් යම් යම් ප්‍රතිලාභ අත්පත් කරගන්නාක් මෙන් ම අධ්‍යාත්ම ශක්තීන් උත්තේජනය කිරීමෙන් සසර පැවැත්ම හෝ නැවැත්ම දක්වා ද එය සක්‍රීය කළ හැකි ය. බුද්ධත්වය, ප්‍රත්‍යෙක බුද්ධත්වය සහ රහත් බව යනු මෙම ශක්තීන් දියුණු කිරීමෙන් ලද අත්දැකීම් ය. භෞතික ලෝකයේ අභියෝගවලට ද එයින් ප්‍රතික්‍රියා දැක්විය හැකි ය. මෙම අධ්‍යයනය මෙම ශක්තීන් හා පුද්ගල ස්වාධීන චින්තනය විමසා බැලීමට කරනු ලබන ප්‍රයත්නයකි.

**ප්‍රමුඛ පද :** පුද්ගල ශක්තිය, බුදුදහම, භෞතික ලෝකය, ස්වාධීනත්වය